**ජෛව මංකොල්ලය**

# කනාට කනකොක් සුද පෙන්වීම

## බටහිර විද්‍යාව සොබාදහමේ රිද්මය වනසයි


යමක් සම්පතක් වූ විට ඊට වටිනාකමක් දිය හැක්කේය. එනම් එය මිල කළ හැකි දෙයකි. පරිසරය මිල කළ හැකිද? එය අමිල නොවේ ද? බටහිර කල්පනාව පෙරදිග කල්පනාවෙන් වෙන්වන්නේ මෙතැනක දී ය. බටහිර කල්පනාවෙන් – චින්තනයෙන්- කියන්නේ පරිසරය මිල කළ හැක්කක් ය යන්න බව ඔවුන් පරිසරය සමඟ සම්බන්ධතා පවත්වන ආකාරයෙන් පෙනේ

පෙරදිග ජාතීන් වෙත කාන්දුකරවනු ලබන බටහිර ජාතීන්ගේ ක්‍රමවේද විශේෂයෙන්ම විද්‍යාව හා තාක්ෂණය මෙන්ම දේශපාලන හා ආර්ථික ක්‍රමවේද පෙරදිග ජාතීන් දීර්ඝ කාලයක් මුළුල්ලේ හුරුපුරුදු කළ ක්‍රමයට ගැලපෙන්නේ නැති බව කියන්නෝ බොහෝ වෙති. එසේම එය දැන් දැන් හොඳින් පැහැදිලි වී තිබේ. ඒ බටහිර විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවෙන්වත්, ඒ ආර්ථික හා සමාජ සංකල්ප අනුදත් මගෙහි යාමෙන්වත් පෙරදිග ජාතීන්ගේ මූලික ප්‍රශ්න විසඳී ඇති බවක් නොපනෙන නිසා ය.

මේ තේරුමින් බටහිර විද්‍යාවේ ආකල්ප හා ඒවායේ භාවිතයත්, ඒවා පෙරදිගට ගලපාලීමට වෙර දැරීමත් ප්‍රශ්න රැසක් උද්ගතන කොට තිබේ.

පාරිසරික ප්‍රශ්න ඉන් එකකි. ස්වභාවධර්මය මත ලාභාපේක්ෂිත අර්ථ දැක්වීම් හා ඒවායේ ප්‍රායෝගික භාවිතයක් පැටවීම එකකි. ජෛව මංකොල්ලය යනු එවන් එක් වැයමකි.

ජෛව මංකොල්ලය මෙන්ම බටහිරින් පෙරදිගට පටවන වෙනත් කවර හෝ පීඩාවක් පෙරදිග පැවැත්මට අත්‍යවශ්‍ය නොවන බව පෙන්වා දෙන පෙරදිග විද්වත්හු සිටිති. ඔවුන් පැහැදිලි කොට දෙන ආකාරයට පෙරදිග සංවර්ධන න්‍යායට එනම් විද්‍යාව ප්‍රමුඛ එහි භාවිතය වන තාක්ෂණය යොදා ගැනීමේ ක්‍රමවේදයට තිබෙන්නේ මූලික උපකල්පන තුනකි.



**ඉන් පළමුවැන්න වන්නේ පරිසරයේ ජීවියෙකුගේ පැවැත්ම පිළිබඳ සියලු කරුණු ප්‍රාග්ධනය (මුදල්) සමඟ හුවමාරු කළ හැකිය යන්න විශ්වාස කිරීමය.**

විද්‍යාව දියුණුවට පත් වූ මුල්කාලයේදීම බටහිර ජාතීන් කල්පනා කළේ, ආර්ථික වර්ධනය මඟින් ජීවිතයේ සියලු සැප සම්පත් ලබා ගත හැකි බව ය. වෙළෙඳපොළ දියුණු කිරීම මඟින්, පැවැත්ම පිළිබඳ සියලු ගැටළු විසඳෙන බව ය.

පරිසරය යනු සම්පතක් බව අර්ථ දැක්වෙනුයේ මේ චින්තනය තුළ ය. යමක් සම්පතක් වූ විට ඊට වටිනාකමක් දිය හැක්කේය. එනම් එය මිල කළ හැකි දෙයකි. පරිසරය මිල කළ හැකිද? එය අමිල නොවේ ද? බටහිර කල්පනාව පෙරදිග කල්පනාවෙන් වෙන්වන්නේ මෙතැනක දී ය.

බටහිර කල්පනාවෙන් – චින්තනයෙන්- කියන්නේ පරිසරය මිල කළ හැක්කක් ය යන්න බව ඔවුන් පරිසරය සමඟ සම්බන්ධතා පවත්වන ආකාරයෙන් පෙනේ. මිනිසුන්ගේ ද අනෙක් සතා සීපාවන්ගේ ද ඕනෑ එපාකම් පිරිමැසූ වනාන්තර හෙළි කොට තනි බෝගයක් වැවීම සංවර්ධනයක් යැයි බටහිර ජාතීහු කල්පනා කරති.

ඒ අයුරින්ම මිනිසුන් මෙන්ම සතා සීපාවා සමඟ මිහිමත තිබූ ජලය, ඒ ජීවීන්ගේ අවශ්‍යතා වලින් මුදවා කෘෂි බෝග වගාවට යොමු කොට තිබේ.

ස්වභාවධර්මයේ නියමයන්ට අනුව ගලා යන ජල පහරවල් හරස් කොට වේලි බැඳ ඒ ජලය හරවාගෙන ගොස් කැලෑ කපා හෙළූ බිමක තනි වගාවකට ජලය යොදා ගනී. ජලය මිලට ගනී. විකුණයි. ස්වභාව ධර්මයේ නිර්මාණයන් සමඟ ප්‍රාග්ධනය බද්ධ කොට තිබේ.

මේ කටයුත්ත, පරිසරය සම්පතක් යැයි කියන බටහිර ජාතීන්ගේ ආකල්පයට හරියටම ගැලපේ. එහෙත් එය පරිසරය අමිල යැයි කියන පෙරදිග ජාතිකයන්ගේ කල්පනාවට නම් ගැලපෙන්නේ නොවේ.

පෙරදිග සමාජය තුළත් භාණ්ඩ හුවමාරුව හා වෙළෙඳම ස්ථාපිතව තිබුණේය. එහෙත් එය විසින් ස්වභාවධර්මය අභියෝගයට ලක් කළේ නැත.

ස්වභාවධර්මය ජය ගැනීමේ වුවමනාව හෝ අදහසවත්, ස්වභාවධර්මය වෙනස් කිරීමේ අදහසවත්, පෙරදිග ජාතීන් සතු වූයේ නැත. වෙළෙඳපොළට මුල් තැන නුදුන් ඒ අර්ථ ක්‍රමය, පරිසරයේ සමතුලිතතාවට ගරු කරන එය රකින එකක් වූවේ ය.

බටහිර විද්‍යාව හා තාක්ෂණ භාවිතයෙන් ගොඩ නැංවෙන සමාජයේ සංවර්ධනය පිළිබඳ ක්‍රමවේදයේ දෙවැනි උපකල්පනයත් මීට සම්බන්ධය. එමඟින් මේ බටහිර ආකෘතිය සවිමත් කරයි.

**මින් දෙවැන්න වන්නේ, පරිසරය තුළ සිදුකරන නිෂ්පාදන කාර්යයන් හා පරිසර සංරක්ෂණය එකිනෙකට සම්බන්ධයක් නැති කටයුතු ලෙස සැලකීමය.**

බටහිර සමාජවාදී ආර්ථික ක්‍රමයේදීත්, ධනවාදී ආර්ථික ක්‍රමයේදීත් මූලික වශයෙන් කල්පනා කරන්නේ නිෂ්පාදනය වැඩි කිරීමට ය. විද්‍යාව හා තාක්ෂණය නිෂ්පාදනය වැඩි කිරීමේ උපක්‍රමය විදිහට යොදවා ගෙන තිබේ.

මේ අයුරින් නිෂ්පාදනය වැඩි කිරීම ස්වභාවධර්මයේ රිද්මය වෙනස් කරමින් සිටී. ජාන ඉංජිනේරු විද්‍යාත්මකව ආහාර බෝග, ඖෂධ වර්ග තැනීමත්, ජෛව තාක්ෂණයෙන් දරුවන් බිහිකිරීමත්, වෙනත් ජෛව තාක්ෂණ භාවිතයනුත් ස්වභාවධර්මයේ රිද්මයට හරස් වී සිටියි.

62 පිටුවට

# කනාට කනකොක් සුද ...

36 පිටුවෙන්

එහෙත් ඉන් සිදුවන නිෂ්පාදනයේ වැඩිවීම ගැතම කල්පනා කරන බටහිර ජාතීන් සිතන්නේ මේ කටයුතු ස්වභාවධර්මයට පිටින් විද්‍යාගාර හා වගා බිම් තුළ පමණක් පවතින කටයුතු කියා ය. මේ නිෂ්පාදනයෙන් උපන්න දේ පරිසරය රැකීමට යොදවන්නේ ඒ නිසා ය.

නිෂ්පාදන මාදිලීන් පරිසරයට එක් කලාසේම ඒ මුදලින් පරිසරය සංරක්ෂණය කිරීමට බටහිර ප්‍රතිපත්ති සම්පාදකයෝ කටයුතු කරති. වනජීවී රක්ෂිත හා ජීව විද්‍යාත්මක රක්ෂිත ඇති කිරීම වෙනුවෙන් ඒවායේ උපන්, ඒවායේ ජීවත් වූ මිනිසුන් (ආදිවාසීන්) එලවා දමමින් සිටින්නේ මේ බටහිර සංරක්ෂණ ක්‍රමවේදයට අනුව ය. මේ සංරක්ෂණ උපක්‍රමය තුළ මුදල් යොදවන්නේ මිනිසුන් හැර අනෙක් සතාසීපාවා හා ගහකොළ රැක ගැනීමට ය. ඉදින් බටහිර සංරක්ෂණ න්‍යායට අනුව පරිසරය යනු මිනිසුන්ගෙන් තොර වූ යමකි. සංරක්ෂණයට මිනිසුන් අයත් නොවන්නේ ඒනිසා ය.

එහෙත් පෙරදිග සංරක්ෂණයේ මූලිකාංග වූයේ මේවා නොවේ. කාලයක් මුළුල්ලේම පෙරදිග ජාතීන් තමන්ගේ නිෂ්පාදනයට සීමා ස්වභාවධර්මයෙන් සොයා ගෙන තිබේ. ස්වභාවධර්මය වෙනස් කරන එය ඉක්මවා යන නිෂ්පාදන රටාවක් පෙරදිග ජාතීන්ට තිබුණේ නැත. පරිසරයේ ගහකොළ වලටවත් ඒවා භාවිත කිරීමේ දැනුමටවත් පේටන්ට් බලපත් වැනි බලපත්‍රයක් ලබා ගැනීම තවමත් පෙරදිග ජාතීන්ට නොතේරෙන්නේ ඒනිසා ය. වතුර විකුණන්න පුළුවන්දැයි ඔවුන් අසන්නේ ඒනිසා ය. දඩයමේ යාමට අවසර පත් ඕනැදැයි ආදිවාසීන් අසන්නේ ඒනිසා ය. තමන්ගේ පරම්පරාවන් ජීවත් වූ ගම්බිම් රජයේ ඉඩම් යැයි කී විට රජය කියන්නෙ කවුරුන්දැයි ඔවුන් අසන්නේ ඒනිසා ය.

මේ අයුරින් නිෂ්පාදනය වැඩි කිරීම එක් අතකින් පරිසර සංරක්ෂණය තවත් අතකත් තිබෙන තාක් කල් පරිසරය සංරක්ෂණය වන්නේ නැති බව පෙරදිග ජාතීන් විසින් පෙන්වා දී ඇත.

නිෂ්පාදනය පසුපස පළමුවෙන් එලවා යන බටහිර ආකල්ප බිහිකොට තිබෙන්නේ ආර්ථික පිළිවෙතකදී අවශ්‍ය කරනු ලබන නොයෙකුත් ගෘහ උපකරණ, කාර්යාලීය උපකරණ, සමාජ උපකරණ, ආහාර පාන යනාදිය තාක්ෂණ පියවර රාශියක් පසුකරමින් පැමිණි ඒවා ය. ඉදින් ඒවා නිෂ්පාදනය කිරීමේදී පරිසරය විනාශ කෙරෙන ප්‍රමාණය ඉන් උපයන මුදලින් සොච්චමක් වැයකොට නැවත 'සැකසීමට' බටහිර ජාතිහු කල්පනා කරති.

අනෙක් අතට මේ ප්‍රාථමික ආර්ථික පිළිවෙළ තුළ ජීවත් වන්නන්ට බටහිර ජාතීන් විසින් කෘත්‍රිම අවශ්‍යතා පෙළක් හඳුන්වා දී තිබේ. ඒවා ස්වභාවධර්මයේ රිද්මය සමග දෝලනය වූ පෙරදිග ජාතීන් අන්දමන්ද කළේ අද ඊයේ නොවේ. මේ සියල්ල මගින් මිනිසුන්ගේ නරක ගති ඉස්මතු කරමින් ඒවා ඉදිරියට තල්ලු කරමින් සිටියි. ස්වභාවධර්මය ගුණාත්මක අතින් පසුපසට තල්ලු වී යමින් තිබේ.

මේ අයුරින් ක්‍රියාත්මක බටහිර සංවර්ධන න්‍යායේ තුන්වැනි උපකල්පනය දෙවැන්න සමග සම්බන්ධිත ය.

**මින් තුන්වැන්න වන්නේ, ස්වභාවධර්මය වෙනුවට මුදල් ආදේශ කළ හැකිය යන්න විශ්වාස කිරීමය.**

මුදල් උපයා ගැනීමට ස්වභාවධර්මයේ සම්පත් යොදා ගැනීමත්, ඉන්පසුව ඒ මුදලින් නැවත ස්වභාවධර්මය ස්ථාපිත කළ හැකිය යන්නත් බටහිර සමාජ ආකල්පවල මුල් බැසගත් එකකි.

විනාශ වී යන වනාන්තර වෙනුවට වන වගා කටයුතු සිදුකරන්නේ මේ තේරුමිනි. විද්‍යාව හා තාක්ෂණයේ භාවිතාවන් නිසා විනාශ වී ගිය ස්වභාවික පරිසරයන් මැද වන උයන් වැවීමේ කටයුතු වෙනුවෙන් පෙනී සිටින පරිසර සංවිධාන හා පරිසර සංරක්ෂකයින් නියෝජනය කරන්නේ මේ අදහස් පරම්පරාවයි.

මේ ආකාරයෙන් ස්වභාවධර්මයේ අංග ලක්ෂණ ක්ෂය වී යාම මුදලින් ප්‍රතිපූරණය කළ හැකි වේ යැයි කල්පනා කිරීම ව්‍යාපාරික ආකල්පයකි. ආයෝජනයකින් තොරව ප්‍රතිලාභ නොලැබිය හැකිය යන වෙළෙන්දාගේ ආකල්පය බටහිර ජාතීන් විසින් ස්වභාවධර්මය සමග ගනුදෙනුවේදීත් යොදා ගෙන තිබේ.

එහෙත් අතීතයේ පටන් පෙරදිග ජාතන් මේ අයුරින් මහා පරිමාණ ආයෝජනයක් ස්වභාවධර්මය මත හෙළුයේ නැත. වෙළෙඳපොළක් තිබුණත් එය ස්වභාවධර්මය විනාශ කරන එකක් නොවූයෙන් වනාන්තර රැකුණේ ය. ගස් කොළන් කපා දමමින්, සතා සීපාවන් ගව් ගණනක් දුරට එලවා දමමින් ඔවුන් ප්‍රදර්ශණ භාණ්ඩ වශයෙන් සත්වෝද්‍යානවලට ගාල් කිරමින් නිෂ්පාදන කටයුතු කිරීමටවත්, නගර නිර්මාණය කිරීමටවත් ඔවුන් කල්පනා කළේ නැත. රුක් දෙවියන් ඇසුරේ තමන්ගේ දිවිපෙවෙත ගෙන ගිය පෙරදිග ජාතීන්ට ආයෝජනයට දෙයක් තිබුණේද නැත. එවැන්නක් වුවමනා වූයේ ද නැත.

එහෙත් දැන් පෙරදිග ලෝකය යන්නේත් බටහිර ලෝකය යන පාරේමය. විද්‍යාවේ භාවිතයක් විදිහට ඔවුන් දකින්නේ පෙරදිග ජාතීන් දකිනා දේමය. එහෙත් ජෛව තාක්ෂණයෙන් ස්වභාවධර්මයට එරෙහි ගමනක් අරඹා තිබෙනවා පමණක් නොව පෙරදිග ජාතීන් දිළින්දන් බවට පත් කරන ව්‍යාපරයන් ද ක්‍රියාත්මකව තිබේ. ඒ ව්‍යාපාර කලින්ද තිබූ ඒවාය. දැන් පෙරදිග දුප්පතුන් බෝවී සිටිනනේ එනිසා ය. එහෙත් අලුත් තාක්ෂණය සමග එහි ජවය වැඩි කොට තිබේ.

මේ ජව බලයෙන් ගමන් කරන නව තාක්ෂණ භාවිතයන් හා එහි ප්‍රතිඵල නිසා ස්වභාවධර්මයේ රිද්මය සපුරා බිඳ වැටෙන දිනය අප වෙත සමීප වෙමින් තිබෙන්නේය. තවමත් ඒ රිද්මයේ බලමහිමයෙන් (තාක්ෂණයේ බල මහිමයෙන් නොව) ජීවත් වන මිනිසුන් ඇතුළු අනෙක් ගහකොළ හා සතාසීපාවුන් මිහිමතින් අතු ගෑවී යන දිනය අප වෙත සමීප වෙමින් තිබෙන්නේ ය. ❑